# උසස් පෙළ
# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

කාලය

**එස්. විතානගේ**

වර්ෂය

**ප්‍රශ්න පත්‍ර අංක 49**

**සිද්ධාන්ත සමගාමී ප්‍රශ්න පත්‍ර සාකච්ඡාව - පාඩම් ඒකකය 1 සහ 2**

01. ඍජු ආකාර හා දුරස්ථ දත්ත ආදාන කෙටියෙන් පැහැදිලි කරන්න ?

02. මාර්ගගත දත්ත ආදානය සහ මාර්ග අපගත දත්ත ආදනය පැහැදිලි කරන්න.

03. තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණයේ පහසුකම් භාවිතා කළ හැකි සහ එලෙස භාවිතා කල නොහැකි ලෙස කාණ්ඩ දෙකකට සමාජය වෙන්ව පවතී. මෙය .................................................. ලෙස හැඳින්වේ.

ඉහත ජේදයේ හිස්තැනට වඩාත් උචිත වචනය ලියා දක්වන්න.

04. හරිත පරිගණනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද ?

05. තතු බෑම තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණයට අදාල මෙවලම් භාවිතයේ දී ඇති වී ඇති ප්‍රධාන ගැටලුවකි. තතු බෑම යනු කුමක් ද ?

06. චෞරත්වය සහ රචනා චෞරත්වය අතර පවත්නා වෙනස පැහැදිලි කරන්න ?

07. සෙවුම් ඉෂ්ඨ චක්‍රයේ පියවර අවස්ථා 03 ක් යටතේ ලියා දක්වන්න ?

08. පරිගණකයකින් උපරිම කාර්යක්‍ෂමතාවයක් ලබාගැනීමට මෙන්ම සමාන්තර දත්ත සැකසීමක් සඳහා වර්තමානයේ පරිගණක තුළ භාවිතා කරන සකසනයන්ගේ නිර්මිත සැකැස්ම නම්කරනු ලබන්නේ කුමන නමකින් ද ?

09. මාධ්‍යයක දත්තයක් ගබඩා කර ඇති අවස්ථාවක එහි ඇති දත්ත කියවීමට ප්‍රවේශ විය හැකි ආකාර දෙකක් පවතී. එම ආකාරයන් නම් කරන්න ?

10. මහා දත්ත හා සම්බන්ධ ප්‍රධාන ලක්‍ෂණ නම් කරන්න ?

11. වළාකුළු පරිගණක සංකල්පයේ ප්‍රධාන සේවා 03 ක් නම් කරන්න ?

12. චුම්බකිත තීන්ත අනුලක්‍ෂණ කියවනය භාවිතා වන ක්ෂේත්‍රයක් ලියා දක්වන්න ?

13. ප්‍රතිදාන උපක්‍රම ඒවායෙන් ප්‍රතිදාන ලබාදෙන ආකාරය අනුව වර්ග තුනකින් යුක්තය. එම වර්ග තුන ලියා දක්වන්න ?

14. පද්ධති මෘදුකාංග ප්‍රධාන වර්ග තුනකට බෙදා දක්වේ. එම වර්ග තුන නම් කරන්න ?

15. හිමිකම් සහිත මෘදුකාංගයක් භාවිතා කරන නිමල් එය තම හිතවතෙකුට ද පිටපත් කර ලබාදී ඇත. මෙය නෛතිකමය මය ගැටලුවක් ඇති විය හැකි බව සමන් ගේ අදහසයි. ඊට හේතුව විය හැක්කේ කුමක් ද ?

16. විශේෂිත කාර්යයක් සඳහා නිපදවා ඇති උපාංගයක් එය පාලනය කිරීමට භාවිතා කරන ක්‍රමලේඛණයක් එම උපාංගය තුළ ම ස්ථිරව තැන්පත් කර ගැනීමට වඩාත් සුදුසු එය මතක ඒකකය වන්නේ කුමක් ද ?

17. දිශාවන් දෙකටම දත්ත හෝ උපදෙස් ගෙනයාමේ හැකියාව සහිත පථ (බස්) කුමන නමකින් හඳුන්වන්නේ ද ?

18. සකසනය දත්ත සැකසීමක් සිදුකරන විට, නිරන්තරයෙන් අවශ්‍ය වන දත්ත සහ උපදෙස් තාවකාලිකව ගබඩා කර තබාගැනීමට යොදාගනු ලබන මතක ඒකකය කුමන නමකින් හඳුන්වනු ලබන්නේ ද ?

19. පරිගණකයක් බලගැන්වීමට අවශ්‍ය මූලිකම උපදෙස් මාලාව ලබාගන්නේ කුමන මතක ස්ථානයකින් ද ?

20. මෘදු පිටපතක් දෘඪ පිටපතක් බවට පරිවර්තනය කිරීමේ හැකියාව සහිත ප්‍රතිදාන උපාංගය වන්නේ කුමක් ද ?

21. ධාරිත්‍රකයක් (Capacitor) උපයෝගී කරගෙන නිපදවා ඇති මතක ඒකක කුමන නමකින් හඳුන්වන්නේ ද ?
22. සෙවුම් ඉෂ්ඨ චක්‍රය (Fetch Execute Cycle) යනු සකසනයක ක්‍රියාකාරීත්වය විස්තර කරනු ලබන ආකෘතියකි. එය පියවර තුනක් යටතේ දැක්වීමට පුලුවන. එම පියවර ලියා දක්වන්න.
23. අවශ්‍යතා මත සැකසූ මෘදුකාංගයක් (Off the self software) යනු කුමක් ද ?
24. ඍජු දත්ත උපාංගවල වාසි 02 ක් ලියා දක්වන්න.
25. බහුහර සකසනයක පවත්නා වාසිදායක තත්ත්වයන් මොනවා ද ?


## A/L ICT ගොඩයන්න විධිමත් වැඩ පිළිවෙලක්

- සිද්ධාන්ත 12 සහ 13 පොත් දෙක සමඟ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා වැඩපොත ලබාගෙන සිද්ධාන්ත සමඟ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදුකරමින් දැනුම වර්ධනය කරගන්න. (සිද්ධාන්ත පොත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ඇත)
- ඉන්පසු ප්‍රශ්න 1500 කට අධික (බහුවරණ / රචනා) ප්‍රශ්න පොත ලබාගෙන පාඩමෙන් පාඩමට ප්‍රශ්න සහ පිළිතුරු විශ්ලේෂණය කියවන්න.
- කෙටි සටහන් පොත මගින් කෙටි සටහන් කියවා ගන්න.
- www.swithanage වෙබ් අඩවියට ඔන්ලයින් ප්‍රශ්න පත්‍ර භාවිතයෙන් බහුවරණ ප්‍රශ්න සහ පිළිතුරු පුහුණු වන්න.
- වෙබ් අඩවියේ ඇති ප්‍රශ්න පත්‍ර ගබඩාවෙන් ව්‍යුහගත සහ රචනා ප්‍රශ්න පත්‍ර බාගත කරගෙන ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලියන්න.
- ඔබගේ පිළිතුරු S Withanage Youtube චැනලයට යොමු වී ප්‍රශ්න පත්‍ර සාකච්ඡාවට අදාල විඩියෝ මගින් නිවැරදි ද යන්න තහවුරු කරගන්න.
- S Withanage Youtube චැනලය Subscribe කර පාඩම් පැහැදිලි කිරීම් වලට සම්බන්ධ වෙන්න.
- ඔන්ලයින් (Online) පංතියට සහභාගි වන්න. (විමසීම් 071 747111 / 071 5610274)




සිංහල සහ ඉංග්‍රිසි මාධ්‍යයෙන් සමන්විත මෙම පොත් 12 ඔබගේ නිවසට ම ගෙන්වා ගැනීමට 070 2075999 071 5610274 / 071 747 1181 යන අංකවලට කතා කරන්න.